9 - 2

2133

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

87 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I, II
Communication and Media Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. පුරාණයේ රජවරුන් විසින් පදවි තානාන්තර පිරිනැමීම හා රාජාඥා පිළිබඳ සන්නිවේදනය සිදු කරන ලද්දේ,
   (1) සන්නස් මගිනි. (2) පුවරු ලිපි මගිනි.
   (3) සෙල් ලිපි මගිනි. (4) තඹපත් ලියවිලි මගිනි.

2. ශ්‍රී ලංකාවේ පළමු ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාව වන්නේ,
   (1) රුහුණු සේවයයි. (2) රජරට සේවයයි.
   (3) මහනුවර සේවයයි. (4) පලාලි සේවයයි.

3. වර්තමානයේ කිසියම් පුද්ගලයෙක් බාහිරින් විවිධ සංදේශ ලබා ගැනීමේදී බහුල ලෙස භාවිත කරන නාලිකාවන් සමන්විත වන්නේ,
   (1) ජනමාධ්‍යයන්ගෙන් ය. (2) පංචේන්ද්‍රියන්ගෙන් ය.
   (3) අන්තර්ජාලයෙන් ය. (4) පුවත් වෙබ් අඩවිවලින් ය.

4. මුල්කාලීන පුවත්පත්වල හිඩැස් පිරවීම සඳහා යොදාගත් ලියවිලි වර්තමානයේ හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
   (1) විශේෂාංග (2) තීරු ලිපි (3) කර්තෘ වාක්‍ය (4) මෘදු ප්‍රවෘත්ති

5. පාසල් මාධ්‍ය සමාජය විසින් සමරනු ලබන ලෝක 'සිනහ දිනය' සඳහා කතාවක් පැවැත්වීමට ඔබව තෝරාගෙන තිබේ. මෙය කවර සන්නිවේදන වර්ගයකට අයත් වේ ද?
   (1) අන්තර්පුද්ගල සන්නිවේදනය (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
   (3) ජනසන්නිවේදනය (4) සමූහ සන්නිවේදනය

6. ග්‍රාහකයා වින්දනයක් ලැබීමට බොහෝ විට ඉඩ ඇත්තේ කවර පුවත් කියවීමෙන් ද?
   (1) මෘදු පුවත් (2) කාලීන පුවත්
   (3) දෘඪ පුවත් (4) සමීප පුවත්

7. ශ්‍රී ලංකාව තුළ රූපවාහිනී මාධ්‍ය ආරම්භය හා සම්බන්ධ පුරෝගාමී පුද්ගලයෙකු වන්නේ,
   (1) ඩී.එම්. කොළඹගේ ය. (2) ශාන් වික්‍රමසිංහ ය.
   (3) වික්ටර් අයිවන් ය. (4) සිරිසේන විමලවීර ය.

8. පෝල් ඩී මැසෙනියර් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රවෘත්ති පිළිබඳ සමීකරණයට අයත් **නොවන්නේ,**
   (1) සමතුලිත බවයි. (2) විශ්වසනීයත්වයයි.
   (3) සරල බවයි. (4) පැහැදිලි බවයි.

[දෙවැනි පිටුව බලන්න.

9. වාචික සන්නිවේදනයේදී ඉහළ ම වැදගත්කමක් හිමි වන්නේ,
   (1) මුඛයට ය. (2) උච්චාරණයට ය. (3) වචනවලට ය. (4) ශබ්දයට ය.

10. පුවත්පතක සිනමා හා නාට්‍ය පිටුව භාරව සිටින්නේ,
   (1) ප්‍රධාන කර්තෘ ය.
   (2) නියෝජ්‍ය කර්තෘ ය.
   (3) විශේෂාංග කර්තෘ ය.
   (4) පුවෘත්ති කර්තෘ ය.

11. හැරල්ඩ් ඩී. ලැස්වෙල් දක්වන ආකාරයට සන්නිවේදන ක්‍රියාවලියේ අනුපිළිවෙළ වන්නේ,
   (1) සන්දේශය, සන්නිවේදකයා, මාධ්‍ය, ග්‍රාහකයා හා බලපෑමයි.
   (2) සන්නිවේදකයා, මූලාශ්‍රය, සන්දේශය, ග්‍රාහකයා හා බලපෑමයි.
   (3) මූලාශ්‍රය, සන්නිවේදකයා, සන්දේශය, ග්‍රාහකයා හා බලපෑමයි.
   (4) සන්නිවේදකයා, සන්දේශය, මාධ්‍ය, ග්‍රාහකයා හා බලපෑමයි.

12. මුද්‍රිත ප්‍රකාශනයක කල්පැවැත්ම තහවුරු කිරීමට අදාළ උපකරණය වන්නේ,
   (1) පොත් බැඳුම් යන්ත්‍රයයි.
   (2) ලැමිනේටින් යන්ත්‍රයයි.
   (3) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි.
   (4) ඩිජිටල් අනුපිටපත්කරණ යන්ත්‍රයයි.

13. පංති කාමරයේ සිදුකළ අභ්‍යාසයක එක් පියවරක් වූයේ, පන්තියේ සිසුන් 40දෙනාගේ කලින් සකස් කර ගත් විස්තරාත්මක ඉදිරිපත් කිරීමකි. ඒ සඳහා වඩාත් යෝග්‍ය මාධ්‍ය උපකරණය වන්නේ,
   (1) කළු ලෑල්ල යි.
   (2) පත්‍රිකා ලෑල්ල යි.
   (3) සුදු ලෑල්ල යි.
   (4) පිටු පෙරළනය යි.

14. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ප්‍රථම රූපවාහිනී ටෙලි නාට්‍ය කුමක් ද?
   (1) පළිඟු මැණිකේ
   (2) දිමුතු මුතු
   (3) යශෝරාවය
   (4) කඩුල්ල

15. ශ්‍රී ලංකාවේ මාධ්‍ය භාවිතයට අදාළව ඍජු නීතිමය බලපෑමක් සිදුකළ හැක්කේ,
   (1) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට ය.
   (2) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමට ය.
   (3) ශ්‍රී ලංකා කර්තෘ සංසදයට ය.
   (4) නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ය.

16. නිශ්චල ඡායාරූපයක් ලබා ගැනීමේදී අවශ්‍යයෙන් ම තිබිය යුතු අංගය වන්නේ,
   (1) ආලෝකයයි.
   (2) පරිගණකයයි.
   (3) මතක කාඩ්පතයි. (Memory card)
   (4) ජේයාපටලයයි.

17. රූපවාහිනී නාට්‍යයක කොටසින් කොටස වෙනස් තේමා අනුව සැකසී තිබේ නම් එවැන්නක්
   (1) ඒකාංගික නාට්‍යයකි.
   (2) ප්‍රාසාංගික නාට්‍යයකි.
   (3) විවිධාංගික නාට්‍යයකි.
   (4) පෝචළ නාට්‍යයකි.

18. ආයතනයේ නම හා ජනමාධ්‍යයේ නම එකිනෙකට ගැළපෙන වරණය තෝරන්න.
   (1) ලේක්හවුස් - සිළුමිණ
   (2) රූපවාහිනී සංස්ථාව - වසන්තම්
   (3) විජය ප්‍රකාශන - ඩේලි නිවුස්
   (4) ගුවන් විදුලි සංස්ථාව - නෙත් එෆ්.එම්.


19. රාජ්‍ය මාධ්‍ය ආයතනයන්හි ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ,
   (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.
   (2) සභාපති විසිනි.
   (3) ප්‍රධාන විධායක නිලධාරියා විසිනි.
   (4) සාමාන්‍යාධිකාරිවරුන් විසිනි.

20. ගැටුමක් අවස්ථාවකදී ලබා ගත් ඇතැම් ඡායාරූප කිසියම් මාධ්‍යයක් ඔස්සේ පළ කිරීමෙන් වැළකී සිටීම වඩාත් අදාළ වන්නේ,
   (1) මාධ්‍ය බාධකයට යි.
   (2) ගැටුම් නිරාකරණයට යි.
   (3) දොරටුපාලන සංකල්පයට යි.
   (4) සිතුවිලි හසුරවාගැනීමට යි.

21. විදේශීය රූපවාහිනී නාලිකාවක ප්‍රවෘත්ති ප්‍රකාශනයක් සිදුකරනුයේ අප්‍රිකානු යුවතියක වුව ද ඇය සුන්දර ය. මෙම වාක්‍ය ආචාර ධර්ම විරෝධී වන්නේ කවර සංකල්පයකට විශේෂිතව ද?
   (1) ස්ත්‍රී-පුරුෂ සමාජභාවය
   (2) වාර්ගිකත්වය
   (3) වෘත්තියභාවය
   (4) පුරවැසිභාවය

22. එඩවඩ් හාපර්, සායි ලුන්, චාලි චැප්ලින්, ජෝන් ලොගී බෙයාඩ් යන අයගේ දායකත්වය ලැබුණු මාධ්‍ය පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?
   (1) රූපවාහිනී, පුවත්පත්, සිනමා සහ ගුවන්විදුලිය
   (2) ගුවන්විදුලිය, සිනමා, රූපවාහිනී සහ පුවත්පත්
   (3) ගුවන්විදුලිය, පුවත්පත්, සිනමා සහ රූපවාහිනිය
   (4) සිනමා, පුවත්පත්, රූපවාහිනී සහ ගුවන්විදුලිය

23. පහත දක්වා ඇත්තේ පුවෘත්ති වාර්තා කිරීමේදී භාවිත කෙරෙන යටිකුරු පිරමිඩාකාර ආකෘතියයි.




ඉහත දක්වා ඇති ආකෘතියෙහි වඩාත්ම වැදගත් තොරතුරු අඩංගු කොටස වන්නේ,
   (1) A ය.   (2) B ය.   (3) C ය.   (4) D ය.

24. රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද අතරින් නිෂ්පාදන කාර්ය සඳහා වැඩි කාලයක් ගතවන්නේ,
   (1) වාර්තා වැඩසටහන්වලට ය.   (2) විචිත්‍රාංග වැඩසටහන්වලට ය.
   (3) කාලීන වැඩසටහන්වලට ය.   (4) පුවෘත්ති වැඩසටහන්වලට ය.

25. පහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරන්න.
   A – 'කලම්බු ජර්නල්' ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත පළමු පුවත්පතයි.
   B – පුවත්පත් හිමිකාරිත්වය රජය හෝ පෞද්ගලික අංශය හෝ සතු විය හැකි ය.
   C – දේශපාලන පුවත්පත් සැලකෙන්නේ පෞද්ගලික හිමිකාරිත්වය සහිත ඒවා ලෙස ය.
   D – 'ලංකා ලෝකය' ශ්‍රී ලංකාවේ ප්‍රථම ලියාපදිංචි කළ පුවත්පතයි.

ඉහත ප්‍රකාශ අතරින්,
   (1) A හා B පමණක් නිවැරදි ය.   (2) A, B හා C පමණක් නිවැරදි ය.
   (3) B හා C පමණක් නිවැරදි ය.   (4) B, C හා D පමණක් නිවැරදි ය.

26. රාජ්‍ය පාලනයට අදාළ තොරතුරු ගල් කණු මත කොටා තිබීම අයත් වන මූලික සන්නිවේදන ස්වරූපය වන්නේ,
   (1) නිර්වාචික සන්නිවේදනයයි.   (2) සමූහ සන්නිවේදනයයි.
   (3) ලිඛිත සන්නිවේදනයයි.   (4) පුද්ගලාන්තර සන්නිවේදනයයි.

27. විවිධ ජ්‍යාමිතික හැඩතල හා විවිධ රටා අනුව රූප රාමුව තුළ වස්තූන් පිහිටුවීම මගින් ප්‍රියමනාප ඡායාරූපයක් ලබා ගැනීම
   (1) නාභිගත කිරීමයි.   (2) අනාවරණයයි.
   (3) මානනයයි.   (4) සංරචණයයි.

28. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.
   A – සංකේත ගනුදෙනුවක් සිදුවේ.
   B – භූමිකා හුවමාරුවක් දක්නට පුළුවන.
   C – ප්‍රතිපෝෂණය අපේක්ෂා කළ හැකි ය.
   D – ආත්ම භාෂණයක් සිදුවීමට ඉඩ තිබේ.

ඉහත අදහස් අතරින්,
   (1) A හා B පමණක් සත්‍ය වේ.
   (2) B හා C පමණක් සත්‍ය වේ.
   (3) C හා D පමණක් සත්‍ය වේ.
   (4) A, B, C හා D යන සියල්ල සත්‍ය වේ.

[හතරවැනි පිටුව බලන්න.

**29.** රාමු කරගැනීමට හැකිවන සේ, තම අලුත උපන් බිළිඳාගේ ඡායාරූපයක්, විදේශගතව සිටින තම දෙමාපියන් වෙත පුද්ගලිකව යැවීමට ජානකට අවශ්‍ය විය. එයට සුදුසු විධි ක්‍රම වන්නේ,

(1) විද්‍යුත් තැපැල හා SMS පණිවිඩයක් මගිනි.
(2) විද්‍යුත් තැපැල හා සාමාන්‍ය තැපැල මගිනි.
(3) ෆැක්ස් පණිවිඩයක් හා SMS පණිවිඩයක් මගිනි.
(4) ෆැක්ස් පණිවිඩයක් හා සාමාන්‍ය තැපැල මගිනි.

**30.** චලන චිත්‍රයේ ආරම්භය කෙරෙහි බලපෑ අත්හදා බැලීම්වල ඉතිහාසය පිළිබඳ නිවැරදි අනුපිළිවෙළ වනුයේ,

(1) සෙවනැලි නාටක, මෝර්ස් සංඥා, දෘෂ්ටියේ අඛණ්ඩතාව.
(2) මැජික් ලන්තෑරුම, දෘෂ්ටියේ අඛණ්ඩතාව, මෝර්ස් සංඥා.
(3) මැජික් ලන්තෑරුම, සෙවනැලි නාටක, මෝර්ස් සංඥා.
(4) සෙවනැලි නාටක, මැජික් ලන්තෑරුම, දෘෂ්ටියේ අඛණ්ඩතාව.

**31.** දේශනයක් වඩාත් ඵලදායී ලෙස පැවැත්වීමේදී ඔබ වඩාත් අවධාරණයට ගත යුතු කරුණ වන්නේ,

(1) වඩාත් ප්‍රියමනාප ඇඳුම් පැළඳුම්වලින් සැරසී සිටීමයි.
(2) දේශනයට භාවිත කරන උපකරණ හා මෙවලම් ක්‍රියාත්මක කරන ආකාරයයි.
(3) අවස්ථාවට ගැළපෙන ආකාරයට අර්ථාන්විත කථාවක් පැවැත්වීමයි.
(4) හොඳ ඇස් සබඳතාවක් පවත්වාගෙන යාමයි.

**32.** චිත්තරූප මැවිය හැකි භාෂා ශෛලියක් වඩාත් ප්‍රයෝජනවත් වන්නේ,

(1) පුවත්පත් විශේෂාංග රචකයෙකුට ය.
(2) රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදකයෙකුට ය.
(3) ගුවන්විදුලි විස්තර ප්‍රචාරකයෙකුට ය.
(4) මුද්‍රා නාට්‍ය රැඟුමක් ඉදිරිපත් කරන නළුවෙකුට ය.

**33.** 'ගුවන්විදුලි වැඩසටහන් කනට ඇසෙන්නේ එක් වරක් පමණි.' මෙයින් අදහස් කරනුයේ,

(1) සංකීර්ණ කරුණු ඉදිරිපත් කළ හැකි බව ය.
(2) ශබ්දය මාධ්‍යය කරගන්නක් වන බව ය.
(3) ප්‍රචාරය වන අවස්ථාවේදීම අර්ථය ග්‍රහණය කරගත යුතු බව ය.
(4) පරිකල්පනීය මාධ්‍යයක් වන බව ය.

**34.** මාධ්‍ය ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයේ සෘජු මැදිහත්වීමක් දක්නට **නොලැබෙන්නේ**,

(1) නාලිකා සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී ය.
(2) හදිසි නීතිය යටතේ සංදේශ පාලනයේදී ය.
(3) ජනමාධ්‍ය ආයතන කහනම් කිරීමේදී ය.
(4) ආචාරධර්ම පද්ධති ප්‍රකාශයට පත්කිරීමේදී ය.

**35.** නව මාධ්‍ය පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) වට්ස්ඇප්, ෆේස්බුක්, රූපවාහිනිය, විද්‍යුත් තැපැල
(2) කෙටි පණිවිඩ, ෆේස්බුක්, ගුවන්විදුලිය, රූපවාහිනිය
(3) ෆේස්බුක්, වට්ස්ඇප්, විද්‍යුත් තැපැල, කෙටි පණිවිඩ
(4) කෙටි පණිවිඩ, ගුවන්විදුලිය, වට්ස්ඇප්, ෆේස්බුක්

**36.** වඩා ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටි තම නිවස ඉදිරිපිට මහා මාර්ගය දෙසට සංවෘත පරිපථ රූපවාහිනී කැමරා (CCTV) පද්ධතියක් සවිකිරීමට රවී තීරණය කරන ලදී. ඉන් ලබා ගත හැකි ප්‍රධාන වාසිය වන්නේ,

(1) මහ මග සිදුවන අනතුරු පිළිබඳ දර්ශන ප්‍රවෘත්ති ප්‍රකාශයන් සඳහා ලබා දීමයි.
(2) පරිසරයේ පවතින වෙනස්කම් පිළිබඳ වාර්තා විටින් විට ලබා ගැනීමේ හැකියාවයි.
(3) මහ මග ගමන් බිමන් යන අය වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීමට ඇති හැකියාවයි.
(4) සිය නිවසේ ආරක්ෂාව පිළිබඳ වඩා විශ්වාසවන්ත තොරතුරු ලබා ගැනීමේ හැකියාවයි.

37. ලිඛිත සන්නිවේදනයේ දක්නට ලැබෙන නිර්මාණාත්මක ප්‍රකාශ විධියක් **නොවන්නේ**,

(1) ප්‍රස්තාරයි. (2) අභිනයයි. (3) අක්ෂර හැඩයයි. (4) වගුයි.

38. නිෂ්ක්‍රිය ග්‍රාහකයන් පිළිබඳ නිදොස් ප්‍රකාශය තෝරන්න.

(1) මාධ්‍ය සංදේශ මගින් යථාර්ථය පිළිඹිබු කෙරෙන බව විශ්වාස කරයි.
(2) මාධ්‍ය සමග අතිශය සමීප සම්බන්ධතාවන් පවත්වයි.
(3) මාධ්‍යකරුවන් හා මාධ්‍ය අන්තර්ගතය බොහෝවිට අභිරුචියෙන් වර්ණනා කරයි.
(4) බොහෝ විට සමාජීය ප්‍රජාව අතරින් බහුතරයක් නියෝජනය කරයි.

39. පහත දැක්වෙන කරුණු සලකන්න.

A – එක් දොරටුපාලකයෙක් සිටීම
B – වෘත්තීය සන්නිවේදකයන් සිටීම
C – තාක්ෂණික විධික්‍රම භාවිත කිරීම
D – සන්නිවේදක හා ග්‍රාහක පාර්ශ්ව සම්මුඛව සිටීම

ඉහත කරුණු අතරින් ජනමාධ්‍ය පිළිබඳව **නොගැළපෙන** ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි. (4) C හා D පමණි.

40. පහත දැක්වෙන අවස්ථා සලකන්න.

A – වැවක මායිමේ ඇති චෛත්‍යයක රූපයක්
B – මුහුණේ ඇති උපන් ලපයක්
C – ප්‍රවෘත්ති නිවේදනයක් ඉදිරිපත් කරන අවස්ථාවක්
D – නැට්ටුවෙක් ශරීරය රිද්මයට හසුරවන අවස්ථාවක්

ඉහත දැක්වෙන අවස්ථා අර්ථාන්විතව ඉදිරිපත් කිරීමට සුදුසු රූප රාමු අනුපිළිවෙළ වඩාත් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) අති දූර රූපය, අති සමීප රූපය, මධ්‍යම රූපය, දූර රූපය
(2) දූර රූපය, මධ්‍යම රූපය, අති සමීප රූපය, අති දූර රූපය
(3) මධ්‍යම රූපය, අති සමීප රූපය, දූර රූපය, අති දූර රූපය
(4) අති දූර රූපය, මධ්‍යම රූපය, අති සමීප රූපය, දූර රූපය

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 87 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** | **I, II** |
| தொடர்பாடலும் ஊடகக் கல்வியும் | **I, II** |
| Communication and Media Studies | **I, II** |

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** සුහුරු ජංගම දුරකථනය (Smartphone) බහුකාර්ය මෙවලමකි.

(i) එය අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිත කරන අවස්ථාවක් සඳහන් කරන්න.

(ii) සම්මන්ත්‍රණ ඇමතුමක් (Conference call) ලබා ගන්නා අවස්ථාවකදී ඊට සහභාගී විය යුතු අවම සාමාජික සංඛ්‍යාව කොපමණ ද?

(iii) දුරකථන ඇමතුමක් ලබා දීමේදී භාවිත කරන සන්නිවේදන ස්වරූප **දෙකක්** නම් කරන්න.

(iv) ලේඛනගත තොරතුරු යැවීම සඳහා සුහුරු ජංගම දුරකථනයක් භාවිත කළ හැකි අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(v) ජනසන්නිවේදනය සඳහා සුහුරු ජංගම දුරකථනය යොදා ගන්නා ආකාර **දෙකක්** ලියන්න.

(vi) මිතුරෙකු ලබා දෙන දුරකථන ඇමතුමකට ඔබ පිළිතුරු දෙන අවස්ථාව හා සම්බන්ධ සන්නිවේදන මූලිකාංගය කුමක් ද?

(vii) සුහුරු ජංගම දුරකථනයක කැමරාවෙන් ඡායාරූප ගැනීමේදී මතක කාඩ්පත (Memory card) මත අදාළ දත්ත තැන්පත් විය හැකි ය. සාමාන්‍ය ශ්‍රමායික (SLR) කැමරාවක් මගින් ඡායාරූප ගැනීමේදී දත්ත තැන්පත් වීම සිදුවන්නේ කවරක් මත ද?

(viii) මතක කාඩ්පතක් මත ගබඩා කළ හැකි ඡායාරූප ප්‍රමාණය තීරණය වන සාධක **දෙකක්** දක්වන්න.

(ix) සුහුරු ජංගම දුරකථනයක් භාවිත කර ජනමාධ්‍යයක් වෙත තොරතුරු යැවිය හැකි ය. මෙවැනි අවස්ථාවකදී ක්‍රියාත්මක වන ජනමාධ්‍යවේදය කුමක් ද?

(x) සුහුරු ජංගම දුරකථනයක් භාවිත කිරීමෙන් විවිධ ජනමාධ්‍ය එකම තලයකදී ක්‍රියාත්මක කළ හැකි ය. මෙම සංකල්පය හැඳින්වීමට භාවිත කරන යෙදුම කුමක් ද?

**2.** (i) රජයේ හිමිකාරිත්වය දරන පුවත්පත් ආයතනයක් නම් කරන්න.

(ii) ඉහත (i) ට අදාළ මාධ්‍ය ආයතනයට නිල විද්‍යුත් ලිපිනයක් ලබාගෙන තිබීමේ ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

(iii) පුවත්පතක පහත පුද්ගලයන්/අංශ සතු භූමිකාව කෙටියෙන් හඳුන්වන්න.

(අ) ප්‍රධාන කර්තෘ
(ආ) සංස්කරණ අංශය
(ඉ) දැන්වීම් අංශය

(iv) පුවත්පතක අන්තර්ගතයට අදාළ පහත අංගවල භාවිතය පැහැදිලි කරන්න.

(අ) විශේෂාංග ලිපි
(ආ) කාටූන්
(ඉ) තීරු ලිපි
(ඊ) ඡායාරූප

[හත්වැනි පිටුව බලන්න.

3. (i) සාමාන්‍ය මුද්‍රණ යන්ත්‍රයක කාර්යය කාර්යාලයක් තුළදී සිදුකළ හැක්කේ කවර විධික්‍රමයක් භාවිතයෙන් ද?
   (ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ ක්‍රමයේ වාසි **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න.
   (iii) පරිගණකයට අන්තර්ජාල සම්බන්ධතාව ලබා දීම මගින් වෙබ් අඩවියක් නිර්මාණය කර ගත හැකි ය. වෙබ් අඩවියක් භාවිත කිරීමේ වාසි **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iv) අන්තර්ජාල පහසුකම සහිත පරිගණකයක් විද්‍යුත් පුවත්පතක් කියවීම සඳහා භාවිත කළ හැකි ය. විද්‍යුත් පුවත්පතක මූලික ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න.

4. (i) ගුවන්විදුලි මාධ්‍යයේ මූලික සන්නිවේදන ස්වරූපය කුමක් ද?
   (ii) ගුවන්විදුලියේදී භාවිත කළ හැකි බාහිර ශබ්ද ප්‍රයෝග (sound effects) **දෙක** නම් කරන්න.
   (iii) ගුවන්විදුලි මාධ්‍යයේදී භාවිත කරනු ලබන පහත වැඩසටහන් ආකෘති කෙටියෙන් හඳුන්වන්න.
   (අ) කථා
   (ආ) සම්මුඛ සාකච්ඡා
   (ඉ) සඟරාමය වැඩසටහන්
   (iv) ගුවන්විදුලි ශ්‍රාවකයා විචාරශීලි ග්‍රාහකයකු විය යුතු ය. විචාරශීලී ග්‍රාහකයකු සතු විය යුතු නිපුණතා **හතරක්** විමර්ශනය කරන්න.

5. (i) සැම කෙනෙකුටම නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය පිළිගැනෙන, එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ප්‍රකාශයට පත් කරන ලද ලේඛනය කුමක් ද?
   (ii) ජනමාධ්‍ය මගින් සමාජ ප්‍රතිරූප ගොඩනැගීමේදී ඒ සඳහා ඉතා පහසුවෙන් යොදාගන්නා ජනකාන්ත පුද්ගල වර්ග **දෙකක්** නම් කරන්න.
   (iii) පහත තේමා තුනට අදාළ සෞන්දර්යාත්මක ස්වරූපය පැහැදිලි කරන්න.
   (අ) විනෝදාත්මක කාර්යය
   (ආ) රසඥතාව
   (ඉ) නිර්මාණාත්මක චින්තනය
   (iv) ඩිජිටල් ඡායාරූපකරණයේ විශේෂතා **හතරක්** විස්තර කරන්න.

6. (i) වේගයෙන් කැරකෙන වස්තුවක එක් එක් පිහිටීම අතර පරතරය වෙන්ව දැකිය හැකි නොවීමට අදාළ සිද්ධාන්තය කෙසේ හඳුන්වනු ලබන්නේ ද?
   (ii) රූපවාහිනී සංඥා විකාශනයේදී භාවිත ප්‍රධාන තාක්ෂණික ක්‍රම **දෙක** නම් කරන්න.
   (iii) රූපවාහිනී මාධ්‍ය හා සම්බන්ධ ග්‍රාහකයින්ගේ පහත විවිධතා වෙන වෙනම විමර්ශනය කරන්න.
   (අ) ස්ත්‍රී-පුරුෂ සමාජභාවය
   (ආ) වයස් මට්ටම
   (ඉ) අධ්‍යාපන මට්ටම
   (iv) රූපවාහිනී මාධ්‍ය මගින් සමාජයට එල්ල කරන **අහිතකර** බලපෑම පහත සාධක ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (අ) භාෂාව
   (ආ) රසවින්දනය
   (ඉ) ප්‍රචණ්ඩත්වය
   (ඊ) සංස්කෘතිය

7. 'යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා' යන්න මෙවර අන්තර් පාඨශාලීය මාධ්‍ය උළෙලෙහි තේමාව විය.

(i) මාධ්‍ය උළෙලට සමගාමීව පැවති කථික තරගයේදී කථිකයාගේ භාෂා කුසලතාව මැනීමට භාවිත කළ හැකි සාධකයක් නම් කරන්න.

(ii) මාධ්‍ය උළෙලේ චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා භාවිත කළ යුතු මාධ්‍ය උපකරණ **දෙකක්** නම් කරන්න.

(iii) 'ඡායාරූප ශිල්පියා ස්වයං විනයක් ඇති කර ගත යුතු ය.' යන්න පිළිබඳව මාධ්‍ය උළෙලේදී සංවාදයට ලක්විය. ඡායාරූපකරණයේ ආචාරධර්ම **තුනක්** පිළිබඳ සටහන් ලියන්න.

(iv) 'විචාරශීලි ග්‍රාහකයෙකු වන්න' යන තේමාව පිළිබඳව කරුණු **හතරක්** යටතේ රචනාවක් ලියන්න.

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස (සා.පෙළ) විභාගය / க.பொ.த. (சாதாரண தர)ப் பரீட்சை - 2022 (2023)

| විෂය අංකය<br>பாட இலக்கம் | 87 | විෂයය<br>பாடம் | தொடர்பாடலும் ஊடகக் கல்வியும் |
|---|---|---|---|

ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 01 | 11. | 04 | 21. | 02 | 31. | 03 |
| 02. | 02 | 12. | 02 | 22. | 03 | 32. | 03 |
| 03. | 02 | 13. | 04 | 23. | 01 | 33. | 02 |
| 04. | 02 | 14. | 02 | 24. | 01 | 34. | 04 |
| 05. | 04 | 15. | 01 | 25. | 02 | 35. | 03 |
| 06. | 01 | 16. | 01 | 26. | 03 | 36. | 04 |
| 07. | 02 | 17. | 03 | 27. | 04 | 37. | 02 |
| 08. | 03 | 18. | 01 | 28. | 04 | 38. | 04 |
| 09. | 03 | 19. | 01 | 29. | 02 | 39. | 02 |
| 10. | 03 | 20. | 03 | 30. | 04 | 40. | 01 |

- විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 1 x 40 = 40